# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 12,072 — 1960 මාර්තු 2 වැනි බදාදා — 2.3.1960**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## මිල පාලන දැන්වීම්

**1960 අංක 5 දරණ ආහාර මිල නියෝගය**

**කරවල, වියලි ඉස්සෝ**
**සහ**
**වියලි මිරිස්**

**1950 අංක 29 දරණ මිල පාලන පනත**

**නියෝගය**

ගාලු පාලන දිස්ත්‍රික්කයේ සහකාර ආහාර මිල පාලක, කොළඹ මුහන්දිරම්ගේ සොලමන් ද සිල්වා වන මම, 1950 අංක 29 දරණ මිල පාලන පනතේ 3(2) වැනි වගන්තිය සමඟ කියවිය යුතු 4 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලය අනුව—

1960 ජනවාරි මස 25 වැනි දින අංක 12,043 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද 1960 ජනවාරි මස 20 වැනි දින අංක 1 සහ 2 දරණ ආහාර මිල නියෝග අද සිට මෙයින් අවලංගු කරමි.

1960 පෙබරවාරි මස 29 වැනි දින පස්වරු 1ට ගාල්ලේ කච්චේරියේ දී අත්සන් කරන ලදී.

සී. එම්. එස්. ද සිල්වා,
ගාලු පාලන දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිල පාලක.

---

**1960 අංක ඇම්ඇන්/3 දරණ ආහාර මිල නියෝගය**

**අතිරේක ආහාර ද්‍රව්‍ය**
**(වියලි මිරිස්)**

**1950 අංක 29 දරණ මිල පාලන පනත**

**අවලංගු කිරීමේ නියෝගයයි**

මන්නාරම් දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිල පාලක තැන්පත් සන්මුගම් පරමනාදන් වන මම, 1950 අංක 29 දරණ මිල පාලන පනතේ 3(2) දරණ වගන්තිය සමඟ කියවෙන 4 වෙනි වගන්තිය යටතේ මා වෙත පැවරී තිබෙන බලතල අනුව, 1960 ජනවාරි මස 29 වෙනි දින අංක 12,048 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ වියලි මිරිස් සම්බන්ධයෙන් පළ කරන ලද 1960 අංක ඇම්ඇන්/2 හා 1960.1.21 වෙනි දින දරණ ආහාර මිල නියෝගය අද සිට මෙම නියෝගයෙන් අවලංගු කරමි.

1960 පෙබරවාරි මස 29 වෙනි දින අපරභාග 3 ට මන්නාරම් කච්චේරියේ දී අත්සන් කරන ලදී.

ඇස්. පරමනාදන්,
**සහකාර (ආහාර) මිල පාලක තැන,**
මන්නාරම් දිස්ත්‍රික්කය.

323—ජේ. ඇන්. ආර් 8617—4,260 (3/60)

අ. 67 අංකය දරණ ආහාර මිළ නියෝගය

කරවල සහ වියළි ඉස්සෝ

## 1950 අංක 29 දරණ මිළ පාලන පනත

### අවලංගු කිරීමේ නියෝගය

අනුරාධපුර දිස්ත්‍රික්කයේ සහකාර මිල (ආහාර) පාලක තැන්පත් ජෝන් ක්ලැරන්ස් ලක්ෂ්මන් මෙල්ඩර් ගුණරත්න වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 3 (2) වැනි වගන්තිය සමග කියවිය යුතු 4 වැනි වගන්ති යෙන් මා වෙත පැවරී තිබෙන බලතල අනුව, 1960 ජනවාරි මස 18 වැනි දිනය හා 12,037 වැනි අංකය දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1960 ජනවාරි මස 11 වැනි දිනය හා අ. 66 වැනි අංකය දරණ කරවල හා වියළි ඉස්සන් පිළිබඳ නිකුත් කරන ලද ආහාර මිළ නියෝග ය මේ දුන් සිට මෙම නියෝගයෙන් අවලංගු කරමි.

1960 මාර්තු මස 1 වෙනි දින පස්වරු 3.30 ට අනුරාධපුරයේදී අත්සන් කරන ලදී.

ජේ. සී. ඇල්. ඇම්. ගුණරත්න,
අනුරාධපුර දිස්ත්‍රික්කයේ සහකාර මිල (ආහාර) පාලක තැන.

අ. 68 අංකය දරණ ආහාර මිල නියෝගය

අතිරේක ආහාර ද්‍රව්‍ය (වියලි මිරිස්).

## 1950 අංක 29 දරණ මිළ පාලන පනත

### අවලංගු කිරීමේ නියෝගය

අනුරාධපුර දිස්ත්‍රික්කයේ සහකාර මිල (ආහාර) පාලක තැන්පත් ජෝන් ක්ලැරන්ස් ලක්ෂ්මන් මෙල්ඩර් ගුණරත්න වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 3 (2) වැනි වගන්තිය සමඟ කියවිය යුතු 4 වැනි වගන්ති යෙන් මා වෙත පැවරී තිබෙන බලතල අනුව, 1960 ජනවාරි මස 18 වැනි දිනය හා 12,037 වැනි අංකය දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1960 ජනවාරි මස 11 වැනි දිනය හා අ. 64 වැනි අංකය දරණ වියලි මිරිස් පිළිබඳ නිකුත් කරන ලද ආහාර මිළ නියෝගය මේ දුන් සිට මෙම නියෝගයෙන් අවලංගු කරමි.

1960 මාර්තු මස 1 වැනි දින පස් වරු 3.30 ට අනුරාධපුරයේදී අත්සන් කරන ලදී.

ජේ. සී. ඇල්. ඇම්. ගුණරත්න,
අනුරාධපුර දිස්ත්‍රික්කයේ සහකාර මිල (ආහාර) පාලක තැන.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.